www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමාගේ ඩ්‍රෝන් නියෝගය: රාජ්‍ය ඝාතන මෙහෙයුම ආයතනගත කිරීමකි

## Obama's drone order: Institutionalizing a state murder operation

**2016 ජුලි 2**

"ත්‍රස්තවාදී සතුරු කටයුතු වලින් පිටස්තර" රටවල සිදු කරන ලද නීති විරෝධී ඩ්‍රෝන් මිසයිල ප්‍රහාර මගින් සංහාරයට ලක් කරන ලද සිවිල් වැසියන් සංඛ්‍යාව පිලිබඳ "තක්සේරුවක් ඉදිරි සති කිහිපය තුල" ලබා දෙන්නේ යයි පොරොන්දු වීමෙන් මාස තුන හමාරකට පසුව ජූලි 1දා ඔබාමා පරිපාලනය නිකුත් කල සංඛ්‍යාව, විවිධාකාර ස්වාධීන විමර්ශන මගින් ලේඛනගත කරන ලද සංඛ්‍යාවන්ගෙන් කුඩා කොටසක් පමනි.

ජාතික රහස් තොරතුරු සේවා අධ්‍යක්ෂ (ඩීඑන්අයි) කාර්යාලය විසින් කෙටුම්පත් කරන ලද මෙම වාර්තාව සමගින් නිකුත් කරන ලද විධායක නියෝගය මගින් "සිවිල් මරන ඇතිවීමේ හැකියාව අඩු කිරීමට අනුගමනය කල හැකි හොඳ ම ක්‍රම" ක්‍රියාවේ යෙදීමට පොරොන්දු වීමට අමතර ව, ලෝකයේ ඕනෑම ප්‍රදේශයක ඕනෑම පුද්ගලයෙකු මරා දැමීමට එක්සත් ජනපද ජනාධිපතිවරයාට ඇති අනුල්ලංඝනීය අයිතිය යලි සහතික කරයි.

සංගත කලමනාකාරීත්වයේ වියලි වචන ලැයිස්තුවෙන් උපුටාගෙන ඇත්තා වූ මෙන් ම එක්සත් ජනපද ජනාධිපතිවරයාගේ විධායක නියෝගය තුල තෙවරක් යොදා ඇත්තා වූ "හොඳ ම ක්‍රම" යන වචන අවධාරනය කරන්නේ, මිනීමරු සමාගම යොදා ගන්නා විධික්‍රම, ඇමරිකානු ධනපති රාජ්‍යය තුල පටිපාටිගත කෙරී ඇති හා ආයතනගත වී ඇති ආකාරය යි.

සීඅයිඒ හා පෙන්ටගන් ශිල්පීන්, වීඩියෝ තිර හරහා තමන් දැකගන්නා, සැතපුම් දහස් ගනන් ඈතක සිට විදින හෙල්ෆයර් මිසයිල ප්‍රහාරවලින් ඝාතනය වන සිවිල් වැසියන් ගනන අඩු කිරීමට කැප වන බව නරුම ලෙස කියාපාන නියෝගයක් සමගින් ධවල මන්දිරය සිය ව්‍යාජ ගනන් හිලවු නිකුත් කලේ, මෙම සන්තතිය දිග දුර ගෙන යාමට යි.

ධවල මන්දිරය නිකුත් කල වාර්තාවට අනුව නව පිලිවෙත සැලසුම් කරනු ලැබ ඇත්තේ, "ත්‍රස්ත විරෝධී කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා කල් පවත්නා නෛතික හා ප්‍රතිපත්තිමය නිර්මාපක වර්ධනය කිරීමට සහ එක්සත් ජනපද ත්‍රස්ත විරෝධී මෙහෙයුම් හා බලය භාවිතා කිරීම අවශ්‍ය වන අනෙකුත් මෙහෙයුම් ආයතනගත කිරීමට ත් වැඩි දියුනු කිරීමට ත්" ය.....

වෙනත් වචනවලින් කියතොත්, බලයේ සිටීමට තවත් යන්තම් මාස හයකටත් අඩු කාලයක් ඇති බැරැක් ඔබාමා, තම කුරිරු දේශපාලනික උරුමයේ මූලිකාංගයක් වන, විදේශිකයන් මෙන් ම එක්සත් ජනපද වැසියන් ද එක හා සමාන ලෙස දේශපාලනික ව ඝාතනයට ලක්කිරීම හෙවත් "ඝාතන ලැයිස්තු" සකසන හා "ඉලක්කගත ඝාතන" සංවිධානය කරන මූලස්ථානය බවට, ධවල මන්දිරයේ ඕවල් කාර්යාලය පරිවර්තනය කිරීම ගැන වගබලා ගැනීමට අධිෂ්ඨාන කර ගෙන සිටියි.

ඝාතක ප්‍රහාර දියත් කිරීමේදී මිලිටරියේ හැකියාව, සියයට 50කින් ඉහල දමන්නා වූ ඩ්‍රෝන් ප්‍රසාරන වැඩපිලිවෙලක් ක්‍රියාවේ යොදවා ඇති ඔබාමාගේ ධවල මන්දිරය, සීඅයිඒහි රහසිගත ඩ්‍රෝන් වැඩපිලිවෙල දිගට ම පවත්වා ගැනීමට අපේක්ෂා කරයි. ඔබාමාගෙන් පසුව ජනාධිපති තනතුරට පත්වීමට ඉදිරිපත් ව ඇති සියල්ලන් ඩ්‍රෝන් ඝාතන අනුමත කොට තිබේ. ඩිමොක්‍රටික් පක්ෂයේ ප්‍රධාන අපේක්ෂිකාව වන හිලරි ක්ලින්ටන් සම්බන්ධයෙන් සලකන කල ඇය, ඔබාමාගේ රාජ්‍ය ලේකම්වරිය ලෙස එම ඝාතනවලට අත්සන් කලාය.

හිතාමතා ඉලක්ක නො කල එහෙත් කුඩුපට්ටම්වී මිය යන මිනිසුන්, ගැහැනුන් හා ළමුන් නිසා මෙම ක්‍රියාදාමයට සිදුවන "අතිරේක හානිය" කෙරෙහි පල කරන ව්‍යාජ කනස්සල්ල වනාහි, කුරිරු මිනීමැරුම් ආවරනය කිරීමට යොදා ගන්නා ව්‍යාජ-මානවවාදී කවරයක් පමනි.

අතීතයේ ඔබාමාගේ ඩ්‍රෝන් ඝාතන ආරක්ෂා කර ඇති *නිව් යෝක් ටයිම්ස්* පත්‍රයට පවා, ඩීඑන්අයි කාර්යාලය 1දා දවල් විධායක නියෝගය හා මරන ගනන් හිලවු නිකුත් කරන ලද්දේ දීර්ඝ සති අන්ත නිවාඩු කාලයක බව සඳහන් කිරීමට බල කෙරුනි. සමීප මහජන නිරීක්ෂනයෙන් ගිලිහී යන්නේ යයි ආන්ඩුව අපේක්ෂා කරන මෙවැනි නිවාඩු කාලයන් වනාහි, නිවේදන නිකුත් කිරීමට සාම්ප්‍රදායික ව

යොදා ගන්නා කාලයන් ය.

මෙම අවස්ථාවේ මෙය කරන ලද්දේ හොඳින් හිතා බලා ය. ඩීඑන්අයි කාර්යාලයෙන් නිකුත් කල තක්සේරුවට අනුව, "සක්‍රීය සතුරුකම් වලින් පිටස්තර", එනම්, ඇෆ්ගනිස්තානය, ඉරාකය හා සිරියාව තුල කරන මහා පරිමාන ඝාතනවලින් පිටස්තර ව, ඔබාමා බලයට පත් වූ 2009 ජනවාරි සිට 2015 අවසානය දක්වා ඝාතනය කල සිවිල් වැසියන්ගේ මුලු එකතුව 64 හා 116 අතර වේ. එක්සත් ජනපද රහස් තොරතුරු කාර්යාංශයෙන් තක්සේරු කොට ඇති 2,372 හා 2,581 අතර වන "සටන්කාමීන්ගේ" මරන සමග මෙය සන්සන්දනය කෙරුනි.

දුරස්ථ පාලක ඝාතක යන්ත්‍රනයේ "සුවිශේෂී නිපුනතාව හා නිරවද්‍ය භාවය නිසා" ඊට කලින් වසරේ "කිසිදු අනවශ්‍ය මරනයක් සිදුව නැතැයි" ඩ්‍රෝන් ඝාතන වැඩපිලිවෙලේ නිර්මාපකයා වන දැනට සීඅයිඒ අධ්‍යක්ෂ ධූරය දරන ජෝන් බ්‍රෙනන් 2011 දී කල ප්‍රකාශයෙන් කැපී පෙනෙන වෙනසක් පෙන්නුම් කරයි. එසමයේ, පාකිස්තානය තුල මරා දැමුනු සිවිල් වැසියන් ගනන දහස් ගනනක් නො වේ නම් සිය ගනනක් වූ අතර එහිදී එම වසරේ මාර්තු මාසයේ බහු විධ එක්සත් ජනපද ඩ්‍රෝන් යානා මගින් විදින ලද හෙල්ෆයර් මිසයිල හතරක් මගින් සුන්කර දැමුනවුන් අතර ආන්ඩුවෙන් අවසර ගෙන රැස්වීමකට සහභාගීව සිටි ගෝත්‍ර නායකයන් 41ක් දෙනෙකු ද අයත් ය.

එහෙත් ඩීඑන්අයි කාර්යාලය විසින් නිකුත් කර ඇති සංඛ්‍යා ඇදහිය නොහැකි තරම් අඩු තක්සේරුවකි. මෙම කරුන අරබයා, නිතර උපුටා දක්වනු ලැබෙන විමර්ශනීය ජනමාධ්‍ය කාර්යාංශය මගින් නිකුත් කර ඇති තත්වාරක්ෂක තක්සේරුවකට අනුව පවා සිවිල් වැසියන් 1,138ක් ඇමරිකානු ඩ්‍රෝන් ප්‍රහාරවලින් ඝාතනයට ලක්ව ඇති අතර එය වොෂින්ටනය කියන ගනනට වඩා දසගුනයකින් වැඩි තක්සේරුවක් පෙන්නුම් කරමිනි.

මෙය පවා ඔබාමාගේ "ඉලක්කගත ඝාතන" වැඩපිලිවෙලේ මරන සංඛ්‍යාව පිලිබඳ සැබෑ තත්වය ගැඹුරු ලෙස අඩු තක්සේරු කිරීමකි. 2014 දී රිප්රීව් නමැති මානව හිමිකම් කන්ඩායම විසින් කරන ලද අධ්‍යයනයකට අනුව, ඇමරිකානු ආක්‍රමනයට හෝ එහි පිලිවෙතට විරුද්ධ වන ඕනෑම අයෙක් ඇතුලත් කරගන්නා හැඳින්වීමක් වන, ධවල මන්දිරය විසින් "ත්‍රස්තවාදීන්" යයි සලකන ලද 41 දෙනෙකු ඝාතනය කිරීමට එල්ල කල ඩ්‍රෝන් ප්‍රහාරවලින් 1,147ක් මිනිසුන් මරා දැමුනි.

2009 හා 2013 අතර යේමනය තුල සිදු කල එක්සත් ජනපද ඩ්‍රෝන් ප්‍රහාර මගින් ඝාතනය කල අවම වසයෙන් 57ක් වන සිවිල් වැසියන්ගේ මරන පිලිබඳ ව ඥාතීන්, සාක්ෂිකරුවන් හා නිලධාරීන් සමග කරන ලද සම්මුඛ සාකච්ඡා තුලින් ලේඛනගත කල හියුමන් රයිට්ස් වොච් පර්යේෂක ලෙටා ටේලර් ද 1දා මාධ්‍ය නිවේදනයට ප්‍රතික්‍රියා දැක්වූවන් අතරට අයත් වේ. "එක්සත් ජනපදය පිලිගන්නා මුලු සංඛ්‍යාවෙන් අඩකට සමාන ගනනක්, මා දැන සිටින ඩ්‍රෝන් ප්‍රහාර හතකදී පමනක් මිය ගොස් ඇතැයි විශ්වාස කිරීම අසීරු ය" යයි ටේලර්, *වොෂින්ටන් පෝස්ට්* පුවත්පතට කීවේ ය.

එක්සත් ජනපද ආන්ඩුවේ සංඛ්‍යා හා අනෙකුත් සියලුම මූලාශ්‍රවල ගනන් හිලවු අතර පවතින යෝධ විෂමතාවට එක් හේතුවක් වන්නේ, ඩ්‍රෝන් මිසයිල ප්‍රහාර මගින් ඝාතනයට ලක්වන සෑම අයෙකු ම වැරදිකරුවන් යයි පූර්ව නිගමනයක් පෙන්ටගනයට හා සීඅයිඒ සංවිධානයට තිබීම යි. වයස 18 හා 80 අතර සෑම පිරිමියෙක් ම ඉබේම වාගේ "සටන්කරුවන්" යයි සලකනු ලැබෙන අතර බොහෝ අවස්ථාවල දී ගැහැනුන් හා ලමුන් ද එම ගනයට වැටේ.

ජාතික රහස් තොරතුරු අධ්‍යක්ෂ ජේම්ස් ක්ලැපර්, මරන තක්සේරු අතර පවතින නො ගැලපීම පිලිබඳව වඩා සරල හා ඇඟ කිලිපොලන විග්‍රහයක් ඉදිරිපත් කර ඇත. ඉහල සංඛ්‍යා, "ත්‍රස්තවාදී සංවිධාන ද ඇතුලත් සමහර අය විසින් හිතාමතා පතුරුවන ලද වැරදි තොරතුරුවල" ප්‍රතිඵලයකි. මෙහි අර්ථය පැහැදිලි ය:"ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" නාමයෙන් කරගෙන යන ගෝලීය ඝාතන වැඩපිලිවෙල ප්‍රශ්නයට භාජනය කරන අයම ද ත්‍රස්තවාදීන් සමග සන්ධානගත ව වැඩ කරන හා එනිසා ම වියහැකි ඉලක්ක ලෙස සලකනු ලැබේ.

බැරැක් ඔබාමාගේ ජනාධිපතිත්වයේ කැපී පෙනෙන මෙම පිලිවෙත, ඩ්‍රෝන් ඝාතන ක්‍රියාමාර්ගය හුදෙක් ඔහුගේ පමනක් නො ව, ඔහු සේවය කරන පරපුටු මූල්‍ය කතිපයාධිකාරයේ හා යෝධ මිලිටරි-රහස් තොරතුරු සංස්ථාපිතයේ අපරාධකාරීත්වය කැටිකොට දක්වයි. ඔවුන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමේ දී රටින් පිටත යුද්ධය අවශ්‍යයෙන් ම රටතුල මර්දනය සමඟ අත්වැල් බැඳගනී.

මෙම ඝාතක වැඩපිලිවෙල ඇමරිකානු රාජ්‍යයේ ස්ථිර අංගයක මට්ටමට එසවීම සඳහා ඔබාමා පරිපාලනය ගන්නා පියවර, කම්කරු පන්තියට ගැඹුරු අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතු ය.

**බිල් වෑන් ඕකන්**

© www.wsws.org